# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබද කමිටු සාකච්ඡාව

දිනය:- 2001-10-12 වන දින පස්වරු 3.00 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ ජී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණී ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස් මැදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. ඒ එම් යු දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
6. ඒ ජේ සතරසිංහ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
7. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී පූර්ව පරීක්ෂාව සඳහා කෙටුම්පත් කරන ලද කෘ.සං.1 හා කෘ.සං.2 උපලේඛන කමිටුව යෝජනා කළ සංශෝධන ඇතුළත් කොට වැඩිදුර සාකච්ඡාව සඳහා ඉදිරිපත් කෙරිණ. දත්ත භාවිතා කරන්නන් දැනුවත් කිරිම සඳහා එක් දින වැඩ මුළුවක් සංවිධානය කිරීමට අදාල කටයුතු සහ නියමු සංගණනය පිළිබඳව ද සාකච්ඡා කරන ලදි .

එහිදී පහත තීරණයන්ට එළඹින.

- සංශෝධිත කෘ.සං.1 උපලේඛනයේ කළයුතු වෙනස්කම් නියමු සංගණනයෙන් පසුව එම අත්දැකීම් ද පදනම් කොට ගෙන වැඩිදුර සලකා බැලීම

<u>කෘසං.2 උපලේඛනය</u>

- කෘ.සං.2 උපලේඛනයේ මුල් පිටුවේ අන්තර්ගතය ඒ අයුරින්ම යොදාගැණීමටත් අනෙක් පිටුවල පහත දැක්වෙන සාංශෝධන ඇතුළත් කිරිම
- කෘ.සං.2 උපලේඛනයේ දෙවන පිටුවේ පොල් වගාවේ ක්‍රමවත් වගාවට අයත් ඵල නොදරණ යටතේ යොදා ඇති පාඨයට ඵල නොදරණ (නොපිදුන වගාව) ලෙස සහ 'ගස්යට වගාව කල ' යන්නට 'යටි වගාව' ලෙසත් සහ 'ගස්යට වගාව නොකල' යන්න 'අතත් වගාව' ආදී වශයෙන් සඳහන් කිරීම
- 4 වන කොටස වෙනත් ස්ථිර භෝග සඳහා ප්‍රාදේශීය මට්ටමින් වැදගත් යයි සැළකෙන භෝග කිහිපයක් හෝ ඇතුළත් කිරිමට හැකි වනසේ විවෘත තීරු කිහිපයක් සඳහා ඉඩ හැරීම සහ දැනටමත් නම් සඳහන් කොට දක්වා ඇති භෝග දත්ත භාවිතා කරන්නන්ගේ රැස්වීමේ දිද ඔවුන්ගේ අදහස් අනුව යලි පෙළ ගැස්වීම
- කාලීන භෝග යටතේ ධාන්‍ය වර්ග සහ ප්‍රධාන එළවළු කිහිපයක් ඇතුළත් කිරීම සඳහා අවකාශ සැපයීම

ඒ ඒ ප්‍රා . ලේ. කොට්ඨාශයන්හි නියමු සංගණනය කළයුතු ගම සහ ග්‍රාම නිලධාරි කොටස තෝරා සඳහන් කොට දිස්ත්‍රික් කාර්යාල වලට ලබා දීම සහ සෑම ප්‍රා . ලේ. කොට්ඨාශයකින්ම කෘසං.2 උපලේඛන 20 ක් වත් සම්පූර්ණ කරවා ගැනීම

- අවශ්‍ය ප්‍රශ්න මාලා උපදෙස් සහ ආකෘති පත්‍ර වල පිටපත් සකස් කිරිම
- දත්ත භාවිතා කරන්නන්ගේ රැස්විමට කැඳවීමට අදහස් කර ඇති රජයේ සහ රජයේ නොවන ආයතන වල ලැයිස්තුව සැකසීම ඒ සඳහා ස්ථානයක් ලෙස නරේසා ආයතනය (NARESA) යොදා ගැනිම දිවා ආහාරය ඇතුළත්ව තේ සැපයිම නොවැම්බර් මස 6 වන අඟහරුවාදා දින වෙන්කිරීම

පස්වරු 4. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලේඛනඥ